**IHP**
INSTITUTE FOR HEALTH POLICY

**72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව**
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

# PRESS RELEASE

---

**නිකුත් කිරීම**

දිනය: 2024 ජනවාරි 26
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව 12.01

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රීන් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk

**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**


ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

---


# '23 දෙසැම්බර් මාසයේදී ස.ජ.බ. (27%) සහ ශ්‍රී.ල.පො.පෙ. (10%) අභිබවමින් සියලුම වැඩිහිටියන්ගෙන් 39%ක ප්‍රතිශතයක් ලබමින් ජා.ජ.බ./ජ.විපෙ. ඉදිරියෙන්

## *2023 දෙසැම්බර් IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම*

2023 දෙසැම්බර් IHPහි සංශෝධිත SLOTS MRP ආකෘතියේ (2024 ජනවාරි සංශෝධිත) නවතම ඇස්තමේන්තුවලින් පෙන්නුම් කරන්නේ ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගෙන් 39%ක් සමඟින් ජා.ජ.බ./ජ.විපෙ. මහ මැතිවරණ ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රායෙන් ඉදිරියෙන් සිටින බවයි. මෙය 27%ක් ලැබූ ස.ජ.බ. ට, 10%ක් ලැබූ ශ්‍රී.ල.පො.පෙ. ට, 6%ක් ලැබූ එ.ජා.ප.ට සහ 3% බැගින් ලැබූ දෙ.ජා.ස. (ඉ.ත.අ.ක.) සහ ශ්‍රී.ල.මු.කො ට වඩා සැලකිය යුතු ලෙස ඉදිරියෙන් සිටියි. දෙසැම්බර් ඇස්තමේන්තු තාවකාලික වන අතර ප්‍රධාන පක්ෂ හතර සඳහා 2.0-3.5% ක දෝෂ ආන්තිකයක් සමඟ ගණනය කර ඇත.



සංශෝධිත IHP SLOTS ආකෘතියේ ඇස්තමේන්තු මගින් වඩාත් පැහැදිලිව පෙන්නුම් කරන්නේ වත්මන් ජා.ජ.බ./ජ.විපෙ. හි පෙරමුණ ගැනීම, 2022 මුල් භාගයේ සිට අඛණ්ඩ වර්ධනයකින් යුතුව සිදුව ඇති බවයි. ස.ජ.බ ද ජා.ජ.බ./ජ.විපෙ.ට වඩා මන්දගාමී වේගයකින් යුතුව සිය සහයෝගය වැඩි කර ගෙන ඇති අතර 2022 මැද භාගයේ සිට දෙවන ස්ථානයේ පවතී. 2023 දෙසැම්බර් ඇස්තමේන්තු මගින් 2023 ජූලි මාසයේ සිට ශ්‍රී.ල.පො.පෙ. සඳහා ස්ථාවර සහායක් පෙන්නුම් කරන අතර එ.ජා.ප.ට ලැබෙන සහයෝගය අඩුවීමක් ද තහවුරු කරයි.




මෙම ප්‍රතිඵල පදනම් වී ඇත්තේ IHP SLOTS MRP ආකෘතියේ ප්‍රධාන සංශෝධනයක් මත වන අතර, මෙමගින් මාසික වෙනස්කම් වඩාත් සුමට කිරීම සහ නියැදීමේ විෂමතාවයන් නිසා ඇතිවන උච්චාවචනයන් අඩු කිරීමට අදහස් කෙරේ. මෙම ඇස්තමේන්තු සියලුම වැඩිහිටියන් සඳහා පෙන්නුම් කරන අතර පෙර මාස මෙන් අපේක්ෂිත ඡන්දදායකයින්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඉස්මතු නොකරයි. IHP මගින් අපේක්ෂිත ඡන්දදායක ආකෘතිය වැඩිදියුණු කිරීමට කටයුතු කරමින් සිටින අතර අනාගත යාවත්කාලීන කිරීමකදී අපේක්ෂිත ඡන්දදායකයින්ගේ ඡන්ද අභිප්‍රාය පිලිබඳ නිකුත් කිරීම නැවත ආරම්භ කරනු ඇත. නමුත් පසුගිය වසර දෙක තුළ බොහෝ ඇස්තමේන්තු සඳහා සියලුම වැඩිහිටියන් සහ අපේක්ෂිත ඡන්දදායකයින් අතර ඡන්ද අභිප්‍රායන්හි වෙනස සාමාන්‍යයෙන් 1-2% ක් වී ඇති බව සටහන් කළ යුතුය.

2023 දෙසැම්බර් යාවත්කාලීන කිරීම, 2021 ඔක්තෝබර් මස සිට ශ්‍රී ලංකාව පුරා සිටින වැඩිහිටියන් සමඟ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 14,941ක් මත මෙන්ම 2023 දෙසැම්බර් මාසයේ දී පමණක් සිදු කරන ලද සම්මුඛ පරීක්ෂණ 522ක් මත පදනම් වේ. IHP SLOTS MRP ක්‍රමවේදය තුළදී ප්‍රථමයෙන් 'multilevel statistical model" මගින් ප්‍රතිචාර දක්වන්නන්ගේ විවිධ ලක්ෂණ සහ ඔවුන්ගේ අදහස් අතර සම්බන්ධය ඇස්තමේන්තු කරයි, මෙහිදී 'අද මහ මැතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කුමන පක්ෂයටද' යන්න යොදා ගෙන ඇත. පසුව එය 2021 ඔක්තෝබර් සිට සෑම මාසයකම ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය පුරෝකථනය කිරීමට ('post-stratification') ජාතික ජනගහනයට ක්‍රමාංකනය කරන ලද විශාල දත්ත ගොනුවක් භාවිතා කරන ලදී. Multilevel model පවතින අවිනිශ්චිතතාවයන් පිළිබිඹු කිරීමට සහ දෝෂ ආන්තිකය ලබා ගැනීමට ආකෘතිය 100 වතාවක් ඇස්තමේන්තු කර ඇත.

**පසුගිය වාර්තා ihp.lk වෙතින් ලබා ගත හැකිය**


සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මාර්තු, "2023 පෙබරවාරි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු. ජා.ජ.බ./ජ.වි.පෙ., ස.ජ.බ. සහ දෙ.ජා.ස. වටා වැඩි ඡන්දදායකයින් ප්‍රමාණයක් ඒකරාශී වී ඇති අතරම එයින් ජා.ජ.බ./ජ.වි.පෙ. පැහැදිලි ලෙසම පෙරමුණ ගනී.", SLOTS වාර්තාව #2023-06. [https://ihp.lk/publications/docs/SLOTSReport202306.pdf](https://ihp.lk/publications/docs/SLOTSReport202306.pdf) යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 අප්‍රේල්, "2023 මාර්තු IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම: මාර්තු මාසයේ ඡන්ද මනාප වල සුළු වෙනසක්, ජා.ජ.බ./ජ.වි.පෙ. ස.ජ.බ. ට වඩා පැහැදිලි ලෙස ඉදිරියෙන් සිටියි, එ.ජා.ප.යේ නැගිටීමේ ලකුණක් පෙන්නුම් කරයි.", SLOTS වාර්තාව #2023-11. [https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230419.pdf](https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230419.pdf) යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මැයි, "ජා.ජ.බ./ජ.වි.පෙ. තව දුරටත් ඉදිරියෙන් සිටින අතරම, ස.ජ.බ. සාපේක්ෂව සම මට්ටමේ පවතින අතරතුර එ.ජා.ප. සහ අනෙකුත් පක්ෂ සඳහා වන සහයෝගය අඩු වෙමින් පවතියි. 2023 අප්‍රේල් IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම", SLOTS වාර්තාව #2023-15.
https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230525.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජූනි, "2023 මැයි මාසයේදී, 23% ක සහයක් ලැබූ ජා.ජ.බ./ජ.විපෙ. අභිබවා 26%ක් ලබා ගත් ස.ජ.බ. ඉදිරියට පැමිණ ඇති අතර එ.ජා.ප.සහ ශ්‍රී.ල.පො.පෙ.සඳහා වූ සහයෝගයේ ද වැඩි වීමක් පෙන්වයි. 2023 මැයි IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම", SLOTS වාර්තාව #2023-18.

https://ihp.lk/news/pres_doc/IHPPressRelease202306301.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජූලි, "2023 ජූනි මාසයේදී ජා.ජ.බ./ජ.වි.පෙ. සහ ස.ජ.බ. සඳහා වූ සහයෝගය පහත වැටී ඇති අතර, එමඟින් සියලු පිළිගත් පක්ෂ කෙරෙහි ජනතා කලකිරීම තවදුරටත් ඉස්මතු කර දක්වයි. 2023 ජූනි IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම.", SLOTS වාර්තාව #2023-22.
https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230727.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 අගෝස්තු, "ජූලි මාසයේදී ප්‍රධාන පක්ෂ සඳහා සහයෝගය සුළු වශයෙන් වෙනස් වී ඇති අතර ජා.ජ.බ./ජ.විපෙ. සහ ස.ජ.බ. ඉදිරියෙන් සිටී, නමුත් ඡන්ද දායකයින් විශාල සංඛ්‍යාවක් දායකත්වය දක්වා නොමැත. 2023 ජූලි IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම.", SLOTS වාර්තාව #2023-26.
https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230821.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 සැප්තැම්බර්, "ස.ජ.බ. අභිබවමින් අගෝස්තු මාසයේ ඡන්දදායකයින් අතර ජා.ජ.බ./ජ.විපෙ. ඉදිරියෙන් සිටී. 2023 අගෝස්තු IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම.", SLOTS වාර්තාව #2023-30.
https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230925.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ඔක්තෝබර්, "සැප්තැම්බර් මාසයේදී SJB (22%) සහ UNP (13%) අභිබවා, NPP/JVP 42%ක අපේක්ෂිත ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් ඉදිරියෙන් සිටී. 2023 සැප්තැම්බර් IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම.", SLOTS වාර්තාව #2023-34.

https://ihp.lk/news/pres_doc/IHPPressRelease20231023.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 නොවැම්බර්, "ඔක්තෝම්බර් මාසයේදී ඡන්දදායකයින්ගේ අභිප්‍රායන්හි සුළු වෙනසක් පෙන්නුම් කරන අතර, 40% ප්‍රතිශතයක් ලබමින් NPP/JVP ඉදිරියෙන් සිටියි. 2023 ඔක්තෝම්බර් IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම.",
https://ihp.lk/news/pres_doc/IHPPressRelease20231123.pdf යෙන් ලබා ගත හැකිය.

## සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**විස්තරාත්මක ක්‍රමවේදය**
අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් සහ මුහුණට මුහුණ සම්මුඛ පරීක්ෂණ මඟින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. යම් මාසයක ප්‍රකාශිත ඡන්දය තක්සේරු කිරීම සඳහා සියලුම SLOTS සම්මුඛ සාකච්ඡාවල දත්ත යොදා ගනිමින් Multilevel Regression and Post-Stratification (MRP) ආකෘතියකට ගැලපීම තුළින් එම

ආකෘතියේ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගෙන බහුවිධ ඇස්තමේන්තු (multiple imputation) භාවිත කරමින්, IHP විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු කරයි.

2023 දෙසැම්බර් MRP ඇස්තමේන්තු, එම මාසය තුල පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ 522ක් සහ 2021 ඔක්තෝම්බර් 1 සිට 2024 ජනවාරි 7 දක්වා පැවැත්වූ මුළු සම්මුඛ පරීක්ෂණ 14,941ක් මත පදනම් වන අතර ජා.ජ.බ. /ජ.විපෙ., ස.ජ.බ., එ.ජා.ප., ශ්‍රී.ල.පො.පෙ., ශ්‍රී.ල.නි.ප., දෙ.ජා.ස., ශ්‍රී.ල.මු.කො., ල.ක.කො. පක්ෂ සඳහා 0.8-3.4%ක සහ අනෙකුත් පක්ෂ සඳහා 4%ක දෝෂ ආන්තිකයක් සමඟ ඇස්තමේන්තු කර ඇත. මීට පෙර සිදුකල යාවත්කාලීන කිරීමට වඩා දෙසැම්බර් යාවත්කාලීන කිරීමේදී නවතම දත්ත කට්ටලය භාවිතා කරන බැවින්, පෙර මාස සඳහා ඡන්ද ඇස්තමේන්තු අගයන්හි සුළු වෙනස්කම් සිදු ව ඇත. දෝෂ ආන්තිකය තක්සේරු කිරීම සඳහා ආකෘති නිර්මාණයේදී stochastic simulations 100ක් භාවිතා කරන ලදී.

MRP යනු විශ්ලේෂණයට කුඩා සාම්පල භාවිත කිරීම සඳහා වෙනත් රටවල ඡන්ද ආයතන විසින් සුලබව භාවිත කරනු ලබන ක්‍රමයකි, විශේෂයෙන් YouGov විසින් එක්සත් රාජධානියේ බ්‍රෙක්සිට් ජනමත විචාරණයේ සහ මෑත කාලීන එක්සත් රාජධානියේ මහ මැතිවරණයේ ප්‍රතිඵල පුරෝකථනය කිරීමට මෙම ක්‍රමය භාවිතා කළේය. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අධ්‍යාපනය, භූගෝලීය පිහිටීම සහ 2019 ජනාධිපතිවරණයේ සහ 2020 මහ මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අනුව නියැදිය ජාතික ජනගහනයට ගැළපෙන බව සහතික කිරීමට සියලු ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා මීට පෙර අරමුදල් සපයන ලදී. IHP මහජන සුබසාධන පර්යේෂණ අරමුදල සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් වර්තමාන පර්යේෂණ කටයුතු සඳහා මූල්‍ය දායකත්වය දක්වයි. අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. තවද, සමීක්ෂණයේ සොයාගැනීම් හරහා අතීත සහ වර්තමාන අරමුදල් සපයන්නන්ගේ අදහස් හෝ ස්ථාවරයන් පිළිබිඹු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.